NCP/CS/ED/11/3-1

2024.12.19

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ 05/2024

නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු සේවා),

පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,

පළාත් පාලන කොමසාරිස්,

උතුරු මැද පළාත.

**<u>දෙසැම්බර් 31 දිනට පෙර ඉදිකිරීම් කොන්ත්‍රාත් වල බිල්පත් පියවීම</u>**

2024 වර්ෂයට අදාළව ඔබගේ අධීක්ෂණය යටතේ විවිධ දෙපාර්තමේන්තු හා ආයතනවල සිදුකරන ලද ඉදිකිරීම් සියල්ලක්ම පාහේ මේ වන විට අවසන් වෙමින් පවතින බව, අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් මා වෙත වාර්තා කර ඇත.

02. කෙසේ වුවද, වැඩ නිම වූ කොන්ත්‍රාත්වල බිල්පත් ගෙවීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශ වෙත ඉදිරිපත් වීමේ ප්‍රමාදයක් දක්නට ඇත.

03. වර්ෂය අවසාන වීම සඳහා මේ වන විට ඉතිරිව ඇත්තේ වැඩකරන දින 06 ක් පමණි. ඒ අනුව, එකී දින කිහිපය තුළ සියලු බිල්පත් සහතික කොට ගෙවීම් කටයුතු සිදු කර නිම කළ යුතුවේ.

04. එබැවින්, ඔබගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලද ඉදිකිරීම් භාරව කටයුතු කරන ඉංජිනේරුවරුන් හා තාක්ෂණ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දී, බිල්පත් ඉදිරිපත් කිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස කාරුණිකව දන්වමි.

05. තවද, දෙසැම්බර් 31 දිනයේදී බිල්පත් සිය ගණනක් අමාත්‍යාංශ තුළ ඒකරාශී වීමෙන් එකී බිල්පත්වලට අදාළ ඉදිකිරීම් සම්බන්ධව අවශ්‍ය පසු විපරම් සිදු නොකොටම ගෙවීම් කටයුතු කිරීමට සිදුවේ. පසුගිය විගණන විමසුම් බොහොමයක මෙම කරුණ දැඩි අවධානයට ලක් කොට ඇත.

06. එබැවින්, අමාත්‍යාංශවල ගිණුම් අංශවලට අදාළ බිල්පත් ගෙවා නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ඉතිරි කර දෙන පරිදි වැඩ නිමවන කොන්ත්‍රාත්වල බිල්පත් ඒ හා සමගම පරීක්ෂා කොට අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කිරීමට ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙස නැවතත් අවධාරණය කරමි. මේ සඳහා ප්‍රවාහන පහසුකම් හෝ වෙනත් පහසුකම් අවශ්‍ය වේ නම් , අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් අමතා එකී පහසුකම් සලසා ගන්නා ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.එම්.ඩබ්.එස්.සමරදිවාකර
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.